මගේ අංකය : CSWP/FIN-SUP/07/FI/01

2019.01.\\

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්/පාලන/පිරිස් හා පුහුණු)

අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන)

විගණන අධිකාරී (රජයේ විගණන අංශය)

ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්

<u>වත්කම් කළමනාකරණ පද්ධතිය සඳහා තොරතුරු ලබා ගැනීම.</u>

බස්නාහිර පළාත් ගොඩනැගිල්ලෙහි ස්ථාපිත අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වල සියළුම ඉන්වෙන්ට්‍රිගත හා පාරිභෝගික භාණ්ඩ පිළිබඳ සම්පූර්ණ විස්තර ඇතුළත් කිරීම සහ කළමනාකරණය සඳහා වත්කම් කළමනාකරණ පද්ධතියක් (Asset Management System) හඳුන්වා දීමට ප්‍රධාන ලේකම් කාර්යාලය විසින් මේවන විටත් මූලික කටයුතු ආරම්භ කර ඇත.

02. එහි පළමු අදියර ලෙස ප්‍රධාන ලේකම් කාර්යාලය සතු සංචලනය කලහැකි ඉන්වෙන්ට්‍රි භාණ්ඩ පිළිබඳ තොරතුරු මෙම පද්ධතියට ඇතුළත් කිරීමට අපේක්ෂා කෙරේ. මේ වනවිටත් මූල්‍ය අංශය සතු සංචලනය කලහැකි ඉන්වෙන්ට්‍රි භාණ්ඩ පිළිබඳ තොරතුරු මෙම පද්ධතියට ඇතුළත් කර ඇති අතර ඒ අනුව ප්‍රධාන ලේකම් කාර්යාලයේ අනෙකුත් අංශ සතු ඉන්වෙන්ට්‍රි භාණ්ඩ පිළිබඳ තොරතුරු කඩිනමින් මෙම පද්ධතියට ඇතුළත් කරගත යුතුවේ.

03. එබැවින් මෙය ප්‍රමුඛ කාර්යයක් ලෙස සලකා පහත පරිදි ක්‍රියාකර අවශ්‍ය තොරතුරු ලබාදීමට කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

i. මූල්‍ය අංශය සමග මෙම කටයුතු සම්බන්ධීකරණය කිරීම සඳහා අංශය නියෝජනය කරමින් නිලධාරීන් දෙදෙනකු ( එක් මාණ්ඩලික නිලධාරියකු ඇතුළුව) ඇමුණුම 01 මගින් පත්කර එවීම.

ii. අංශය සතුව දැනට පවතින සංචලනය කල හැකි ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සම්බන්ධ සියළු තොරතුරු ඇමුණුම 02 ආකෘතිය ප්‍රකාරව ඉදිරිපත් කිරීම (තොරතුරු ඉදිරිපත් කිරීමේදී දක්වා ඇති උදාහරණය අනුව සම්පූර්ණ කිරීම කළ යුතුය). එහිදී Category ID හා Category Name යන තීරු සම්පූර්ණ කිරීමේදී ඇමුණුම 03 හි i- vii දක්වා ඇති Category ID හා Category Name භාවිතා කළ යුතුය. ඇමුණුම 03 ලැයිස්තුවේ අන්තර්ගත නොවන කිසියම් වර්ගයක ඉන්වෙන්ට්‍රි භාණ්ඩයක් වේ නම් ඒබව මූල්‍ය අංශයේ පහත දක්වා ඇති කාර්යභාර නිලධාරීන් වෙත දැනුම් දී අවශ්‍ය උපදෙස් ලබා ගැනීම හා ඒ අනුව ක්‍රියා කිරීම.

iii. ඔබගේ පහසුව සඳහා ඉහත (i) හා (ii) මගින් දක්වා ඇති සියළු ආකෘති පත්‍ර හා ඇමුණුම් ප්‍රධාන ලේකම් කාර්යාලීය chiefsec.wpc.gov.lk/finance_v2/en යන වෙබ් අඩවියේ Download හි Asset Management System මගින් ලබා ගත හැක.

04. ඉහත (iii) ඔස්සේ ලබා ගන්නා ලද ආකෘති පත්‍ර වල මෘදු පිටපත් නිසි පරිදි සම්පූර්ණ කර 2019.01.18 දින හෝ ඊට පෙර supply@cs.wpc.gov.lk යන විද්‍යුත් ලිපිනයට එවීමට කටයුතු කරන්න.

05. මෙම කාර්යයෙහි කාර්යභාර නිලධාරීන් ලෙස මූල්‍ය අංශයේ පහත නිලධාරීන් ක්‍රියාකරන අතර මේ සම්බන්ධ වැඩිදුර තොරතුරු එම නිලධාරීන් අමතා ලබා ගන්නා ලෙස වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

| නම | තනතුර | දුරකථන අංකය | අභ්‍යන්තර දුරකථන අංකය |
|---|---|---|---|
| ටී.ජී.හර්ෂණී තඹවිට මිය | ගණකාධිකාරී(සැපයීම්) | 0112092643 | 3386 |
| මල්කා රත්නසූරිය මිය | සංවර්ධන නිලධාරී | 0112093380 | 3380 |

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය)